**ශීර්ෂය 122 – පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 122 – පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 දෙසැම්බර් 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,403.56 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,502.32 ක් උපයෝජනය කර තිබුණි.ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,901.24 ක් හෙවත් සියයට 55.86 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,255.18 | 1,218.21 | 36.97 | 2.94 |
| ප්‍රාග්ධන | 2,148.38 | 284.11 | 1,864.27 | 86.78 |
| එකතුව | 3,403.56 | 1,502.32 | 1,901.24 | 55.86 |

**2 .2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15.00 | 14.15 | 5.00 | 9.27 | 42.00 | 23.91 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ ගිණුම් අංක 7002/0000/00/0143/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 0.23 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 106.45 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0166/000 | 0.01 |
| 6000/0000/00/0013/0121/000 | 106.39 |
| 6000/0000/00/0020/0018/000 | 0.05 |
| එකතුව | 106.45 |

**2.5 විගණන නිරීක්ෂණය**

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ

විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 | පවත්වා නොතිබුණි. |
| (ii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 211 | පවත්වා නොතිබුණි. |
| (iii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ඨය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iv) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (v) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදි ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට හා ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2017 නොවැම්බර් 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 8.66 ක් වී තිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබූ රු.මිලියන 1,799.70 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවති අතර, වැය විෂයයන් 02 කට වෙන්කර තිබූ රු.මිලියන 4.40 ක ප්‍රතිපාදනයෙන් වෙනත් වැය විෂයයන් දෙකකට රු.මිලියන 3.50 ක් මාරුකර තිබුණි. ඉතිරි රු.මිලියන1.90 ප්‍රතිපාදනය උපයෝජනය කර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 98 ක පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 05 දෙනෙකුට අවස්ථා 08 කදී එකතුව රු.327,700 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2006 ඔක්තෝබර් 23 දිනැති අංක බීඩී/356/280/3/එස් දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව විදේශීය ටෙලිනාට්‍ය, චිත්‍රපට හා වෙළඳ දැන්වීම් වෙනුවෙන් අයකරනු ලබන බදු ආදායම්, භාර අරමුදලක් පිහිටුවන තෙක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට උපදෙස් ලබා දී තිබුණි. 2009 නොවැම්බර් 04 දිනැති කැබිනට් තීරණය අනුව එම බදු ආදායම් තැන්පත් ගිණුමකට බැර කිරීමට හා එම මුදල් රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ඉදිකිරීම් හා ඊට අනුෂාංගික කටයුතු සඳහා යෙදවීමටත් අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද, 2017 අප්‍රේල් 30 දින වන විටත් ඉහත සඳහන් භාර අරමුදල පිහිටුවා නොතිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට අංක 6000/0000/00/0013/0012/000 දරන තැන්පත් ගිණුමේ රු.මිලියන 106.40 ක ශේෂයක් පැවතුණි. එසේම භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ මුදල රු.මිලියන 551.54 ක් විය.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 12201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සේවය ගොස් සිටින නිලධාරීන්ගෙන් හිඟහිට තිබුණු ණය ශේෂය රු.22,588 ක් විය. එය වර්ෂ 05 වැඩි කාලයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ තිබෙන ආයතන 13 ක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 52 ක් පැවැත්විය යුතු වුවද, රැස්වීම් වාර 17 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

රන්මිහිතැන්න ටෙලිසිනමා ගම්මානයේ රූ ගත කිරීමට සහභාගී වන අයට කාමර පහසුකම් සැපයීමට ඒ, බී හා සී ශ්‍රේණියේ කාමර වර්ග 03 ක් යටතේ කාමර 43 ක් ඉදිකර තිබුණත් සමාලෝචිත වර්ෂය තුළදී ඒවායේ උපයෝජනය පිළිවෙලින් සියයට 04, සියයට 08 හා සියයට 08 ක් විය.

**(ආ)** **ලැබිය යුතු ශේෂ**

-------------------

2006 මාර්තු 31 දිනැති රජයේ ගැසට් පත්‍රයේ දෙවන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලද 2006 අංක 11 දරන මුදල් පනතේ 7 වගන්තියට අනුකූලව රූපවාහිනී නාලිකා 02 ක් සම්බන්ධයෙන් ආනයනික චිත්‍රපට, ටෙලිනාට්‍ය හා වාණිජ වැඩ සටහන් වෙනුවෙන් පසුගිය වර්ෂ 07 සඳහා 2016 දෙසැම්බර් 31 වන විට අයකළ යුතු රු.මිලියන 21.54 ක බදු මුදල අයකරගෙන නොතිබුණි.

## 3.9 අනුකූල නොවීම්

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(අ) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණි.

## 3.10 කාර්යසාධනය

-----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

----------------------------------------------------

රන්මිහිතැන්න ජාතික ටෙලිසිනමා උද්‍යාන පදනම පනත බලාත්මක කර නොතිබුණි.

**(ආ)** **සැලැසුම් කිරීම**

-----------------

(i) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට යෝජිතව තිබුණු මාධ්‍යවේදීන් සඳහා වූ මාධ්‍ය පුරවර නිවාස යෝජනා ක්‍රමය ඉදිකිරීම, සාර්ක් මාධ්‍ය හුවමාරු වැඩසටහන ශ්‍රී ලංකාවේදී පැවැත්වීම හා අමරදේව සංගීත අසපුවේ ඉදිකිරීම් ආරම්භ කිරීම යනාදී කටයුතු සිදුකර නොතිබුණි.

(ii) 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් (දේශීය/ විදේශීය) වැඩසටහන් 18 ක් සඳහා රු. 1,000,000 ක් වෙන්කර තිබුණ ද 2016 වර්ෂය තුළදී වැය කර තිබුණේ රු.669,000 පමණි. කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා පුහුණු කිරීම් ඉතා වැදගත් අංගයක් වුවත් 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි කාර්ය මණ්ඩල පුහුණු කිරීමට පාලන අධිකාරිය අපොහොසත්ව තිබුණි.

## 3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

---------------------------------------

**ගැලපුම් කළයුතු ශේෂ**

------------------------

(අ) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අංශය විසින් 2016 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත්, මාස 06 ක සිට වර්ෂ 03 ක කාලයක් දක්වා බැංකුව වෙත ඉදිරිපත් නොවූ රු.896,589 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) උපලබ්ධි නොවූ රු.219,710 ක් වටිනා තැන්පතු මාස 06 ක සිට වර්ෂ 03 දක්වා කාලයක සිට පැවත එමින් තිබුණ ද, ඒවා උපලබ්ධි නොවීමට හේතු සොයා බලා කටයුතු කර නොතිබුණි.

## 3.12 පාඩු හා හානි

---------------

සමාලෝචිත වර්ෂයේ රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානයේ ආදායම රු.11,216,073 ක් වුවද එහි වියදම රු. 17,943,718 ක් වීම හේතුවෙන් රු. 6,727,645 ක පාඩුවක් නිරීක්ෂණය විය.

## 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | **වර්ෂය** | **ඡේද** | |
| (i) | 2012 | 8 (ආ)(ii) | රන්මිහිතැන්න ටෙලිසිනමා උද්‍යානය සඳහා වෙනම පනතක් ඇති කිරීමට 2012 ක්‍රියාකාරී සැලැස්ම යටතේ සැලසුම් කර තිබුණද, 2016 මැයි 31 දින වන විටත් පනතක් සම්මත කර නොතිබුණි. |
| (ii) | 2012 | 12 (අ) | රන්මිහිතැන්නට නිකුත් කළ ප්‍රවේශපත් හා ලැබූ ආදායම අතර නිරීක්ෂණය වී තිබූ රු.99,305 ක ඌනතාවය සම්බන්ධයෙන් 2016 මැයි 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (iii) | 2012 | 12(ඒ) | 2012 වර්ෂයේදී නිම කිරීමට යෝජිත ජනමාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහය 2016 මැයි 31 දින වන විටත් නිමකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2012 | 1.13(ඇ) | ගුවන් විදුලි සහ රූපවාහිනී නාලිකා පවත්වා ගැනීමට බලපත්‍ර නිකුත් කිරීමේදී, ස්ථිර බලපත්‍ර වෙනුවට තාවකාලික බලපත්‍ර නිකුත්කර තිබූ අතර ස්ථිර බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීමේ ක්‍රමයක් සකස් කර නොතිබුණි. එබැවින් කිසිදු අධීක්ෂණයකින් තොරව නාලිකාවන්හි විකාශන කටයුතු දිගින් දිගටම සිදු කරනු ලබන බවත් පසුව නිකුත් කර තිබූ තාවකාලික බලපත්‍රවල, පෙර සඳහන් නොවූ කොන්දේසිද ඇතුළත් කර තිබූ බැවින් ආයතන සම්බන්ධව ඒකාකාරී ලෙස තීරණ ගැනීමට නොහැකියාව හා තීරණ ගැනීමේ ගැටළු මතුවී තිබෙන බවද නිරීක්ෂණය විය. |
| (v) | 2013 | 5.11(ආ) | 2006 අංක 11 දරන මුදල් පනතේ 6(1) වගන්තියේ දක්වා ඇති පරිදි ශ්‍රී ලාංකීය ගතිසිරිත් වර්ධනය කිරීමේ අදහසින් විදෙස් රටවල නිෂ්පාදනය කරන වැඩ සටහන් මෙරට විකාශය කිරීම වෙනුවෙන් බද්දක් පනවා තිබුණත් බලපත්‍ර 15 ක් යටතේ ක්‍රියාත්මක වූ කේබල්, චන්ද්‍රිකා, අන්තර්ජාලය හා දුරකථන මත පදනම් වූ රූපවාහිනී නාලිකා තුළින් විකාශය වූ වැඩසටහන් මෙම බද්දට යටත් නොවන බැවින් අදාළ බද්ද පැනවීමේ පරමාර්ථයන් මෙරට තුළ ඉටු නොවන බව නිරීක්ෂණය කෙරේ. තවද, මෙම රැස්කර ගන්නා බදු ආදායම බැර කිරීමට අරමුදලක් පිහිටුවීමට 2009 වර්ෂයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ එකඟ වී තිබුණද එය 2016 මැයි දක්වාම සිදුකර නොතිබුණි. |
| (vi) | 2014 | 3.16 (අ) | කේබල් රූපවාහිනි සඳහා බලපත්‍ර 2012 වර්ෂයේදී ලබාගත් ආයතනයක් නීතිවිරෝධී ආකාරයට කටයුතු කර තිබෙන බව 2013 වර්ෂයේදී සනාථ වී තිබියදීත් අමාත්‍යාංශය විසින් එම ආයතනය සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද පාර්ලිමේන්තු කාරක සභා නියෝග අනුව කේබල් චන්ද්‍රිකා හා අන්තර් ජාලය මත පදනම් වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇති නොකර, 2014 නොවැම්බර් මස දී චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ රූපවාහිනී ජාලයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදී තිබුණි. |
| (vii) | 2015 | 3.11 | ශ්‍රී ලංකා රජයේ හා ජපන් රජයේ ණය ආධාර (JICA Loan) යටතේ 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ භෞමික රූපවාහිනී විකාශන කටයුතු සඳහා අංකන තාක්ෂණය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේදී විදේශීය ණය රු.මිලියන 950 ක් හා විදේශීය මූල්‍යායන ආශ්‍රිත දේශීය පිරිවැය රු. මිලියන 950 ක් වශයෙන් රු.මිලියන 1900 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දී එකී ව්‍යාපෘතිය අත්හිටුවා තිබූ අතර, දේශීය පිරිවැය යටතේ වූ රු.මිලියන 2.7 ක් ව්‍යාපෘතිය සඳහා අවිධිමත් ලෙස පත්කරන ලද කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීමට වැය කර තිබුණි. එම කාර්ය මණ්ඩලය පත්කිරීමද අවිධිමත්ව සිදුකර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (viii) | 2015 | 3.14 (ආ) (ii) | අමාත්‍යවරයාගේ ධුර කාලයට පමණක් වලංගු වන පරිදි සහකාර ලේකම් (කම්කරු සබඳතා - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන) තනතුරට පත්කරනු ලැබ සිටි නිලධාරියාට අමාත්‍යවරයාගේ ධුරය අහෝසි වී පැවති 2015 අගොස්තු 17 දින සිට 2015 නොවැම්බර් 02 දින දක්වා වූ කාල සීමාව සඳහා සේවයට වාර්තා කළ බවට තහවුරු කර ගැනීමෙන් තොරව වැටුප් හා දීමනා ලෙස රු. 117,241 ක් ගෙවා තිබූ අතර, ඉන් අයකරගෙන තිබුණේ රු.33,110 ක් පමණි. |
| (ix) | 2015 | 3.18 (අ) | අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් මාසයේදී රු. 648,312 ක් වැයකර ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳව "FRONTIER" නමින් සඟරා පිටපත් 1,000 ක් මුද්‍රණය කර තිබූ අතර, ඒවා ලේඛණගත කිරීමක් සිදුකර නොතිබුණි. 2017 ඔක්තෝබර් මාසයේ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම සඟරා බෙදා නොහැර අබලි ද්‍රව්‍ය ගබඩාවේ ගොඩගසා දිරාපත් වෙමින් තිබෙනු නිරීක්ෂණය විය. |
| (x) | 2015 | 3.19 (ඇ) | තනතුරෙහි ස්ථිර කර නොමැති අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය) තනතුරේ සිටින නිලධාරියාට, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013 නියමයන්ට අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක වසර හයක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්ට නිකුත් කළ හැකි සහනදායී මෝටර් රථ බලපත්‍රයක් 2015 සැප්තැම්බර් 03 දින ලබාදී තිබුණි. මූලික අවශ්‍යතා සපුරා නොතිබියදීත් මෙම නිළධාරියාට සහනදායී මෝටර් රථ බලපත්‍රයක් ලබාදීම තුලින් රජයට බදු ආදායම් ලෙස ලැබිය යුතු රු.2,271,732 ක මුදලක් අහිමි වී තිබුණි. |

(ආ) අමාත්‍යාංශයට අදාලව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2014 ජනවාරි 22 දින ලබාදුන් නියෝග අතරින් 2016 මැයි 31 දින වන විටත් නිම නොකළ නියෝග පහත දැක්වේ.

| ගිණුම් කාරක සභා වාර්තාවේ නියෝග අංකය | යොමුගත විෂයය |
|---|---|
| (i) 05 | විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහාද පැමිණිලි කළ හැකි පරිදි ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම් පනත සංශෝධනය කිරීම. |
| (ii) 07, 08 | විකාශන සංවර්ධන අධිකාරි පනත සම්මත කිරීම හා පිහිටුවීම, අංකන තාක්ෂණය හඳුන්වා දීම හා ප්‍රගතිය පිළිබඳ කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම. |
| (iii) 12 | රාජ්‍ය මුදල් අයථා ලෙස පුද්ගලික පාර්ශවයන් වෙත යැම වැළැක්වීමට පෞද්ගලික ගුවන් විදුලි නාලිකා හා රූපවාහිනී |

නාලිකා බලපත්‍රලාභීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය, වාර්ෂිකව ගාස්තුවක් අයකිරීම හා බලපත්‍ර අළුත් කිරීමට නියමිත ක්‍රමවේදයක් ඇති කිරීම.

( iv) 13 බලපත්‍රලාභීන්ගේ නිවැරදි තොරතුරු සමාගම් රෙජිස්ට්‍රාර්ගෙන් ලබාගෙන කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම හා කේබල් චන්ද්‍රිකා හා අන්තර්ජාලය මත පදනම් වූ රූපවාහිනී ආයතන සම්බන්ධයෙන් නව ප්‍රතිපත්තියක් ඇතිකිරීම.

(ඇ) අමාත්‍යාංශයට අදාළව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2016 ඔක්තෝබර් 26 දින ලබා දෙන ලද නියෝග අතරින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිම කළ නියෝග පහත දැක්වේ.

| ගිණුම්කරණ කාරක සභා වාර්තාවේ නියෝග අංකය | | යොමුගත විෂයය |
|---|---|---|
| (i) | 10 | පෞද්ගලික ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා ස්ථිර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් ඒ සඳහා සියළු විධිවිධාන ඇතුළත් කර විකාශන අධිකාරී පනත සම්මත කර ගැනීම. |
| (ii) | 12 | හිටපු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට අමාත්‍යාංශයෙන් රු.1,008,307 ක වැටුප් ලබා ගන්නා අතර, එම කාලය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් වැටුප් ලබා ගැනීම වෙනුවෙන් නැවත මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (iii) | 14 | ආනයනික චිත්‍රපට, ටෙලි නාට්‍ය හා වාණිජ වැඩසටහන් වෙනුවෙන් රූපවාහිනී නාලිකා 2ක් වෙතින් පසුගිය වසර 06 ක් සඳහා රු.මිලියන 32 ක හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (iv) | 16 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණාවරණයක් ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව තරඟකාරී මිල ගණන් කැඳවා සුදුසු රක්ෂණ ක්‍රමයක් හා ආයතනයක් තෝරා ගැනීම. |

**3.14** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 19 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 111 | 107 | 04 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 50 | 43 | 07 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) -ජනමාධ්‍ය | | 03 | - | 03 |
| | පාර්ලිමේන්තු කටයුතු | 1125 | 1058 | 67 | - |
| | එකතුව | 1313 | 1231 | 85 | 03 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 18 ක් පිරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබූ අතර, තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සිටින අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.